Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

# බුද්ධ ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් 40 ක් හිමිවේ.

## I - කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 බුදුරජාණන් වහන්සේ 'දුක' පිළිබඳව දේශනා කළ සූත්‍ර දේශනාවකි.

(1) පටිච්ච සමුප්පාදය (2) පුනර්භවය (3) චතුරාර්ය සත්‍යය (4) කර්මය

02 නිවැරදි දැකීම හෙවත් යහපත් අවබෝදය හඳුන් වන්නේ,

(1) සම්මා සතිය නමිනි (2) සම්මා දිට්ඨිය නමිනි

(3) සම්මා සංකප්ප නමිනි (4) සම්මා ආජීව නමිනි

03 අනුබුදු මිහිදු මහ රහතන් වහන්සේ ගේ ලංකා ගමනය සිදු වූයේ

(1) ඇසල පොහොය දිනදීය. (2) වෙසක් පොහොය දිනදීය.

(3) උඳුවප් පොහොය දිනදීය. (4) පොසොන් පොහොය දිනදීය.

04 මාතලේ අලු විහාරයේ දී සංගායනා කරන ලද්දේ කී වෙනි ධර්ම සංගායනාවද?

(1) සිව්වෙනි (2) දෙවෙනි (3) පළමුවැනි (4) තුන්වැනි

05 නාය යෑම්, සුළි සුළං, ගිනිකඳු පිපිරීම්, ලැව්ගිනි ඇති වීම් ආදිය සිදු වන්නේ කිනම් නියාම ධර්මයක් මුල් කර ගෙන ද?

(1) බීජ නියාමය. (2) උතු නියාමය. (3) කම්ම නියාමය. (4) චිත්ත නියාමය.

- **06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06 රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංගයකි. (   )

07 ගුණ ජාතකය තුළින් ප්‍රකට වන්නේ ආදර්ශමත් නායකත්වයයි. (   )

08 දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් වන පරිදි තෘෂ්ණාව දෙයාකාර වේ. (   )

09 අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ මෙරටට වැඩම කළ පිරිස සත් දෙනෙකි. (   )

10 කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි. (   )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියන්න.**

11 සතියක් ඇසිපිය නොහෙලා බෝධීන් වහන්සේ දෙස බලා සිටීම .................................................................. පැවැත්වීම ලෙස හැඳින්වේ.

12 බුදු දහම ........................................................................................................................ දහමකි.

13 රෝග හටගන්නා ක්‍රම අටක් පිළිබඳව ..................................................................... සූත්‍රයේ දක්වේ.

14 තමා උපමාවට ගෙන අන් අයට හිරිහැර නොකිරීම .................................................................................. ලෙස හඳුන්වනු ලබයි.

15 ත්‍රිවිධ චෛත්‍යය මූලික කරගෙන බිහි වූ පුද පූජා ක්‍රමයක් ලෙස .................................................................. දක්විය හැකිය.

( අභිධර්මය, අත්තූපනායික ධර්මය, පටිසෝතගාමී, දළදා පූජාව, අනුසෝතගාමී, අනිමිසලෝචන පූජාව, හිරිමානන්දය, චුල්ලහස්ථි පදෝපම)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 16 | රහසින්වත් පව් නොකිරීම | වේළුද්වාර සූත්‍රය |
| 17 | පිසුණා වාචා | සමාජ සබඳතා |
| 18 | අත්තූපනායික ධර්මය | අරහං |
| 19 | සිඟාලෝවාද සූත්‍රය | සුභාෂණයයි |
| 20 | ප්‍රියමනාප වචනය | කේලාම් කීම |

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) ජේතවනාරාමය හා පූර්වාරාමය බුදු සසුනය පූජා කළේ කවුරුන් ද?

(ii) බුද්ධ චරිතයේ ඉවසීම ප්‍රකට වන අවස්ථා දෙක්ක නම් කරන්න.

(iii) කරණීයමෙත්ත සූත්‍රයෙහි සියලු සත්වයෝ යන්නෙන් අරුත් ගන්වා ඇති සත්වයන් දෙදෙනෙකු නම් කරන්න.

(iv) නියාම ධර්ම වලින් දෙකක් නම් කරන්න.

(v) බුදු දහමට අනුව ධාර්මික ජීවණෝපාය මාර්ග දෙක්ක සඳහන් කරන්න.

(vi) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය යන්න කෙටියෙන් පහදන්න.

(vii) බුදු දහමට අනුව අප අනුන් හා කරන කතා බහ දෙයාකාරයකි. ඒවා මොනවා ද?

(viii) මහින්දාගමනයෙන් අප ලත් දායාද දෙකක් සඳහන් කරන්න.

(ix) උපයන සියල්ල පරිභෝජනය කරන හා උපයන කිසිවක් පරිභෝජනය නොකරන පුද්ගලයන් දෙදෙනා හඳුන්වන්න.

(x) බුදු දහමේ සඳහන් පුණ්‍ය ක්‍රියා අතර දක්වෙන දාන වස්තු දහයෙන් 02 ක් නම් කරන්න.
(ලකුණු 2 x 10 = 20)

02 (i) බුදුගුණ සිහි කරමින් කරනු ලබන භාවනාව කුමක් ද? (ලකුණු 02)

(ii) අනුත්තරෝ පුරිස ධම්ම සාරථී ගුණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) බුදුගුණ භාවනාව නිවැරදිව වැඩීමෙන් ශිෂ්‍ය ජීවිතය සාර්ථක වන අන්දම පෙන්වා දෙන්න.
(ලකුණු 05)

03 (i) විරති හා සමාදාන යන්නෙහි සරළ අදහස ලියන්න. (ලකුණු 02)

(ii) පංච සීලය පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇති කර ගැනීමේ දී විරතියට අනුව අප අවධානය යොමු කළ යුතු අංශ තුන කවරේ ද? (ලකුණු 03)

(iii) පංච ශීලය නිසිලෙස සුරැකීමෙන් ශිෂ්‍යයකුට ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න. (ලකුණු 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04 (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස ........ යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවේ සරළ අදහස ලියන්න. (ලකුණු 03)

(iii) ශිෂ්‍යයකුට අත්තුපනායික ධර්මතාවය අනුගමනය කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 05 ක් ලියන්න. (ලකුණු 05)

05 (i) සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ භාවිත වන විශේෂිත ශාසනික වචන 02 නම් කරන්න. (ලකුණු 02)

(ii) අභයරාජ සූත්‍රයේ සඳහන් වන අප කථා කරන වචන වල ඇතුලත්විය යුතු ප්‍රධාන අංග තුන ලියන්න. (ලකුණු 03)

(iii) හැසිරීම හා කථාබස් පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට වැදගත් වන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 05)

06 (i) 'අරපිරිමැස්ම' යන්නෙහි සරළ අදහස ලියන්න. (ලකුණු 02)

(ii) සිඟාලෝවාද සූත්‍රයට අනුව ධනය කොටස් 04 බෙදා පරිහරණය කිරීමට උපදෙස් ලබා දී ඇත. එයින් තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) අනාගතය සාර්ථක කර ගැනීමට අරපිරිමැස්ම කොතෙක් දුරට ප්‍රයෝජවත් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

07 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) පුණ්‍යය ක්‍රියා යනු මොනවාද? (ලකුණු 02)

(ii) ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා නම් කරන්න. (ලකුණු 03)

(iii) ශිෂ්‍යන් වශයෙන් ඔබට අනුගමනය කළ හැකි පුණ්‍ය ක්‍රියා 05 ක් ලියන්න. (ලකුණු 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 3 (02) 2 (03) 4 (04) 1 (05) 2 (06) ✓ (07) × (08) ×

(09) ✓ (10) ✓ (11) අනිමිස ලෝචන පූජාව (12) පටිසෝතගාමී

(13) හිරිමාන්දය (14) අත්තූපනායික ධර්මය (15) දළදා පූජාව (16) අරහං

(17) කේළාම් කීම (18) වේළුද්වාර සූත්‍රය (19) සමාජ සබඳතා (20) සුභාෂණ

(ල. 20 x 20 = 40)

## II කොටස

01 (i) ජේතවනාරාමය - අනේපිඬු සිටුතුමා / පූර්වාරාමය - විශාඛා සිටු දේවිය
(ii) චිංචා මාණවිකාවගේ අභූත චෝදනා / සුන්දරී පරිබ්‍රාජකාවගේ සිදුවීම / මාගන්දියාගේ පරිභවය
(iii) තසා, ථාවර, දීඝා යනාදී ( පිටු අංක 36)
(iv) උතු, බීජ, කම්ම, චිත්ත
(v) ගොවිතැන, රාජ්‍ය සේවය, සත්තව පාලනය, ආරක්ෂක සේවය .......
(vi) තුන් ආකාරයකින් සිල්වත් විමයි.
(vii) සුභාෂණය හා දුර්භාෂණ
(viii) බුදු දහම, භික්ෂු භික්ෂුණී ශාසනය, අර්ථාන්විත වන්දා ක්‍රම යනාදිය. (පිටු අංක 139)
(ix) උදුම්බරබාදිය, අජද්ධුමාරික
(x) බත්, පැන් වස්ත්‍ර.... ආදිය (පිටු අංක 153)

(ලකුණු 2 x 10 = 20)

02 (i) බුද්ධානුස්සති භාවනාව (ලකුණු 02)
(ii) දමනය කළ නොහැකි සියල්ලන් දමනය කිරීමේ හැකියාවෙන් යුක්ත වීම. (ලකුණු 03)
(iii) මෙම උතුම් බුදුගුණ නිතර නිතර මෙනෙහි කරන්නේ නම් අප තුළ ශ්‍රද්ධාව වැඩි දියුණු වේ සිත දූෂණය කරන කෙලෙස් වලට අප සිත් තුළ සැරිසැරීමට අවසථාව නොලැබේ. එම නිසා ලැබෙන සෑම මොහොතේම බුදුගුන මෙනෙහි කිරීම ඉතා ප්‍රයෝජනවත්ය.නිරතුරුවම බුදුගුණ සිතන වර්ණනා කරන, සිහිකරන වඳින ශිෂ්‍යයන් වන්නට උත්සහා කිරීම ඉතා වැදගත්ය. එමගින් අප තුළ දහම් වර්ධනය වේ. මේ ආදී පිළිතුරකට සම්පූර්ණ ලකුණු පිරිනමන්න. (ලකුණු 05)

03 (i) වරදින් වෙන් වීම හා යහපතෙහි යෙදීම (ලකුණු 02)
(ii) තමා වරදින් මිදීම / අන්අය ලවා වැරදි නොකිරීම / වරද අනුමත නොකිරීම හා ඊට අනුබල නොදීම (ලකුණු 03)
(iii) ලියා ඇති පිළිතුරෙහි සමස්තය ගැන සැළකීමත් වී ලකුණු ප්‍රධානය කරන්න. (ලකුණු 05)

04 (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ ජීවිතං පියං
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ (ලකුණු 02)
(ii) සියල්ලෝද දඬුවමට බියවෙති සියල්ලන්ම ජීවිතයට ප්‍රියය. මෙසේ අනුන් තමා මෙන්ම සළකා අනුන්ට හිංසා පීඩා කොකළ යුතුය අනුන් ඝාතනය නොකළ යුතුය. ඝාතනය නොකරවිය යුතුය. (ලකුණු 03)
(iii) ලියා ඇති පිළිතුරෙහි සමස්ථය ගැන සැළකීමත් වී ලකුණු ප්‍රධානය කරන්න. (ලකුණු 05)

05 (i) සිටිනවා - නිදා සිටිනවා, නිදා ගන්නවා - සැතපෙනවා ..... (පිටු අංක 134) (ලකුණු 02)
(ii) කතා කරන කරුණු සත්‍ය විය යුතුය, හේතු සාධක සහිත විය යුතුය, අසන්නාගෙත් කියන්නාගෙත් යහපත පිණිස හේතු විය යුතුයි. (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06 (i) එදිනෙදා පරිහරණය කරන ස්පත් තිසි කළමනාකරනයකින් පරිහරණය කිරීමයි. (ලකුණු 02)
(ii) පරිභෝජනයට $1/4$ , ආයෝජනයට $2/4$ , ඉතිරියට $1/4$ (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07 (i) දාන, ශීලා දි යහපත් ක්‍රියාවන් (ලකුණු 02)
(ii) දාන, ශීල, භාවනා (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)